**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2016**

**--------------------------------------------------**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2017 අගෝස්තු 18 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව ගණනය කරන ලද තොගය රු.541,201 ක් වුවද, එම අගය රු.836,338 ක් ලෙස මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ තොග ශේෂය රු.295,137 කින් වැඩියෙන් දැක්වුණු අතර වර්ෂයේ ඌනතාවයද එම අගයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාජ සංවර්ධන ආයතනය වෙත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.5,832,151 ක ප්‍රාග්ධන ප්‍රදාන වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණෙන් වර්ෂයේ ඌනතාවයද එම අගයෙන් අඩුවෙන් දැක්වුණු අතර භාණ්ඩාගාර ප්‍රදාන ආරම්භක ශේෂය රු.14,571,241 ක් සන්සන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙනුවෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,739,560 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,428,163 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,167,723 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම රු.3,415,400 කින් අඩුවීමත් සේවක පාරිශ්‍රමික සහ පාඨමාලා ගාස්තු වියදම් රු.8,369,465 කින් වැඩිවීමත් ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයක් පැවතිය ද 2015 වර්ෂයේ මූල්‍ය අතිරික්තයක් බවට පත්වී නැවතත් 2016 වර්ෂයේදී මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.30,319,643 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.72,068,787 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 03 වන වගන්තියට අනුව පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමට නියමිතව තිබුණි.

(අ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්,වැඩ සටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ආ) සමාජ වැඩ, සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.

(ඇ) සමාජ සුභ සාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමාජ වැඩවලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඉ) සමාජ සුභ සාධන කාර්ය මණ්ඩලයේ වෘත්තීයමය සහ කළමනාකාරිත්ව ප්‍රවණතාවය වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබා ගැනීමට සැලැස්වීම.

(උ) ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එහි ප්‍රධාන අංශ 04 වෙනුවෙන් වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණු අතර, ඊට අදාලව සමාලෝචිත වර්ෂයේ සකස් කරන ලද කාර්යසාධන වාර්තාව අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

**(අ) සමාජ සේවා විද්‍යාලය**

-------------------------

i. සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016/2020 සඳහා වූ සමාජ වැඩ පිළිබඳ මූලික උපාධි පාඨමාලාව සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සිසුන් 180 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම්කර තිබුණද, ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් සිසුන් 55 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර සිංහල හා දෙමළ මාධ්‍යයන් සඳහා සිසුන් ඇතුළත් කරවාගෙන නොතිබුණි.

ii. එක් එක් සමාසිකය සඳහා දේශන පැය සියයට 100 ක් සම්පූර්ණ කිරීමකින් පසුව පමණක් අදාළ විභාග පැවැත්වීමට කටයුතු කළ යුතු වුවත්, දේශන පැය 100 සම්පූර්ණ කිරීමකින් තොරව විභාග පවත්වා තිබුණි.

iii. සමාජ වැඩ පිළිබඳව උපාධිය සඳහා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා භාෂා තුනෙන්ම ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සියයට 30 කින් අඩුවී තිබුණි.

iv. සමාජ වැඩ උපාධි පාඨමාලාව, සමාජ වැඩ ඩිප්ලෝමා හා සමාජ වැඩ උසස් ඩිප්ලෝමාවන්ට අදාල 2012/2016, 2013/2017, 2014/2018, 2015/2019 අධ්‍යයන වර්ෂයන්හි විභාග, සමාලෝචිත වර්ෂය තුළ පැවැත්විය යුතුව තිබුණද, එම විභාග පවත්වා නොතිබුණි.

(ආ) **පුහුණු අංශය**

---------------

i. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන් හා ස්වේච්ඡා සංවිධාන කාර්ය මණ්ඩලය හා උසස් පෙළ සමත් සිසුන් වෙනුවෙන් කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා දෙමළ මාධ්‍ය පාඨමාලාව 2014 වර්ෂය තුළ ආරම්භ කොට 2015 වර්ෂයේදී අවසන් කළ යුතුව තිබුණි, කෙසේ වුවද ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම අවුරුද්දකුත් මාස 03 ක් ප්‍රමාද කර තිබුණි.

ii. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන් හා ස්වේච්ඡා සංවිධාන කාර්ය මණ්ඩලය හා උසස්පෙළ සමතුන් සඳහා වු වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් 2014 / 2015 වර්ෂයන්හි දී ආයතනයෙහි පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර, ඒ සඳහා සිසුන් 25 දෙනෙකු සහභාගි වී තිබුණි. මෙම පාඨමාලාව සඳහා 2015 වර්ෂය තුළදී ප්‍රතිඵල නිකුත් කර තිබුණද සහතික ප්‍රදානය වර්ෂයකටත් වැඩි කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ඇ) **සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**

---------------------------------------------------------------

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති සැකසීම,පර්යේෂණ සිදුකිරීම සහ ප්‍රකාශන එළිදැක්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ වැඩ සටහන් දහතුනක් සඳහා රු.1,323,000 ක් වෙන්කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

i. රන්න, අම්පාර, කිලිනොච්චි සහ තලාව යන ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා පාඨමාලා පැවැත්වීමට, පර්යේෂණ දත්ත රැස්කිරීම හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම පමණක් සිදුකර තිබුණි.කෙසේ වුවද, එම මධ්‍යස්ථානවල මෙතෙක් නිශ්චිත පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

ii. නූතන ටෙලිනාට්‍ය කලාව පවුල් ව්‍යුහය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ සොයා බැලීමේ පර්යේෂණ වාර්තාව පිටපත් 200 කින් මුද්‍රණය කිරීමට ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ පිටපත් 100 ක් පමණ මුද්‍රණය කර තිබුණෙන් එහි භෞතික කාර්යසාධනය සියයට 50 ක් ව පැවතුණි. එසේම අපේක්ෂිත සැලසුමට අනුව ප්‍රකාශන ග්‍රන්ථ හා ශාස්ත්‍රීය සඟරා මුද්‍රණය කිරීම ඉතා අඩු මට්ටමක පැවති අතර, අදාළ අංශය හෝ පුද්ගලයන් වෙත සමාලෝචිත වර්ෂය තුළදී බෙදාදී නොතිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 137 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 113 ක් වූයෙන් අනුව පුරප්පාඩු 24 ක් පැවතිණි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 04 ක්ද, ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තනතුරු 03 ක් සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු 03 ක් වශයෙන් තනතුරු 10 ක් ද මහාචාර්ය තනතුරද 2017 ජූනි 30 දින දක්වා පුරප්පාඩුව පැවතිණි. මෙම කථිකාචාර්යවරුන්ගේ පුරප්පාඩු පැවතීම ආයතනයේ බොහෝ පාඨමාලා නිසි පරිදි පැවැත්වීමට නොහැකි වීමට හේතු නොවූයේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කිරීමේදී ඊට ආසන්නතම තනතුරේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වැඩ බැලීම සඳහා පත්කළ යුතු වුවද එම තනතුරේ සේවයේ නියුතු නිලධාරීන් තිදෙනෙකු සිටියදී ඊට පහළ ශ්‍රේණියේ තනතුරක සේවයේ නියුතු නිලධාරියකු පත්කර තිබුණි. එසේම වැඩබැලීමේ තනතුරක් මාස 3ක කාලයකට යටත්වන නමුත්, අදාල තනතුරේ පුරප්පාඩු පිරවීමට වසර 3 කට වඩා වැඩි කාලයක් තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක් වැඩ බැලීමේ පත්වීම පිරිනමා වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) අනුමත බඳවාගැනීමේ කාර්යපටිපාටියට අනුව අධ්‍යක්ෂ ( පාලන හා මුදල්) තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් බඳවාගැනීමේදී තිබිය යුතු සුදුසුකම වූ "කළමනාකරණ සේවා ගණයේ" තනතුරක පළමු ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය යන කොන්දේසිය "අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ" තනතුරක් ලෙස මෙවරට පමණක් අදාලවන පරිදි සංශෝධනය කර අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ තනතුරක සේවයේ නියුතුව සිටි ගණකාධිකරණය පිළිබඳ මූලික දැනුමක් නොමැති නිලධාරිනියකු 2017 මාර්තු 01 දින පත්කරගෙන තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනයේ සංවිධාන සටහන අනුව අභ්‍යන්තර විගණක සෘජුවම ආයතනයේ සභාපති වෙත වාර්තා කළයුතු වුවද, අභ්‍යන්තර විගණක විසින් සෘජුවම ප්‍රධාන විධායක නිලධාරියාවූ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අපේක්ෂිත පාඨමාලා ආදායම් හා වියදම් ඇතුළත්ව පිළියෙල කර නොතිබීමෙන් අයවැය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | - ඇතැම් ගිණුම් තැබීම නිවැරදි නොවීම හා නිරවුල් නොකළ ගිණුම් ශේෂයන් පැවතීම. |
| (ආ) අයවැය පාලනය | - අයවැය සකස් කිරීමේදී භාණ්ඩාගාර ප්‍රතිපාදනයන්ට අමතරව උපයා ගන්නා ආදායම් සළකා නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | - නිසි සුදුසුකම් මත නිලධාරීන් පත් නොකිරීම, නිලධාරීන් පුහුණු කිරීම් හා රාජකාරි කාලය පිළිබඳ නිසි ඇගයීම් නොකිරීම. |